# බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය ( සංස්කෘතික කටයුතු අංශය)

## 2026 වර්ෂය සඳහා සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීම.

බත්තරමුල්ල සෙත්සිරිපාය 08 වන මහලේ පිහිටි බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු , අමාත්‍යාංශය ( සංස්කෘතික කටයුතු අංශය) විසින් 2026 වර්ෂය වෙනුවෙන් පහත දැක්වෙන භාණ්ඩ , සේවාවන් හා වැඩ සපයා ගැනීම සඳහා සුදුසු ආයතන හා පුද්ගලයන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

01. **භාණ්ඩ :**

1. සියළුම කාර්යාලීය ලිපි ද්‍රව්‍ය
2. පරිගණක, ඡායා පිටපත් යන්ත්‍ර සඳහා අවශ්‍ය උපාංග හා ලිපි ද්‍රව්‍ය ( ඩිස්කට්, රිබන්, ටෝනර් හා කඩදාසි වර්ග)
3. සියළුම වර්ගයේ කාර්යාලීය ගෘහ භාණ්ඩ - (දැව,වානේ හා වෙනත් )
4. කාර්යාලීය උපකරණ - ( පරිගණක යන්ත්‍ර , ඡායා පිටපත් යන්ත්‍ර , ස්කෑන යන්ත්‍ර ( Scanner), ෆැක්ස් යන්ත්‍ර, මල්ටි මීඩියා යන්ත්‍ර, කැමරා උපකරණ , ශබ්ද වාහිනී යන්ත්‍ර හා උපාංග, පොත් බැඳීමේ යන්ත්‍ර ඇතුළු සියළුම ආකාරයේ ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ යනාදිය)
5. පරිගණක ආශ්‍රිත උපාංග (USB Pen Drive, Wi-Fi Dongle, Internet (4G) Dongle, Anti-Virus software, Network Accessories ,Hard disk)
6. ටයර් , ටියුබ් හා බැටරි යනාදිය සැපයීම
7. වායු සමීකරණ යන්ත්‍ර සැපයීම.
8. විදුලි උපකරණ හා උපාංග - (ශීතකරණ, විදුලි පංකා, විදුලි කේතල, රූපවාහිනී යන්ත්‍ර ඇතුළු සියළුම වර්ගයේ විදුලි උපකරණ හා ඒ ආශ්‍රිත සියළු විදුලි උපාංග )
9. ගොඩනැගිලි සඳහා තීන්ත හා තීන්ත ආලේපනයට අවශ්‍ය උපකරණ (තිස්සමහාරාම ප්‍රදේශයේ විශේෂයි)
10. ටී ෂර්ට් , කැප් (තොප්පි ) , බොටම් සැකසීම හා නිළ ඇඳුම් රෙදි සැපයීම.
11. වේදිකා පසුතල, නර්තන හා රංග වස්ත්‍රාභරණ, නර්තන හා නාට්‍ය සඳහා අවශ්‍ය රංග භාණ්ඩ සැපයීම.
12. නාම පුවරු හා සමරුළුක සැකසීම.
13. කුසලාන, සමරුතිළිණ, සම්මාන හා පදක්කම් සැකසීම හා කළුන පොත් නිෂ්පාදන කිරීම.
14. පෙරදිග හා අපරදිග වාද්‍ය උපකරණ හා සංගීත භාණ්ඩ සැපයීම.
15. පූර්ව ළමා විය සඳහා සෙල්ලම් මිදුල් ඇතුළු ළදරු පාසල් සඳහා අවශ්‍ය සියළු උපාංග සැපයීම.
16. පිරිකර හා පූජා භාණ්ඩ සැපයීම.
17. පෝසිලේන් භාණ්ඩ සැපයීම ( අඩු කොප්ප , පිඟන් , පීරිසි, ජෝග්ගු)

02. **උපදේශක නොවන සේවා :**

1. ආරක්ෂක සේවය
2. සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවය
3. සියළුම ආකාරයේ මුද්‍රණ කටයුතු (පොත් පත්, පෝස්ටර්, කටවුට්, බැනර්, ආරාධනා පත්‍ර, සහතික හා සියළුම ඩිජිටල් මුද්‍රණ කටයුතු හා ප්ලාස්ටික් අකුරු යනාදිය) හා පොත් බැඳීම් කටයුතු
4. ග්‍රැෆික් නිර්මාණ කටයුතු ( ආරාධනා පත්‍ර, පෝස්ටර්,බැනර්,කුසලාන ආදිය හා කෙටි වීඩියෝ නිර්මාණ ආදි සියළුම පරිගණක නිර්මාණ)
5. ඡායාරූප මුද්‍රණය කිරීම, කාර්යාල හැඳුනුම්පත් සකස් කිරීම හා ඡායාරූප ශිල්පීන් සම්බන්ධීකරණය ( Studio)

6. පරිගණක යන්ත්‍ර, වීඩියෝ උපකරණ, ඩිජිටල් කැමරා, ඡායා පිටපත් යන්ත්‍ර හා ඒ ආශ්‍රිත සියළුම ඉලෙක්ට්‍රෝනික උපකරණ අළුත්වැඩියා කිරීම හා පරිගණක ඇප් සැකසීම.
7. සියළුම වර්ගයේ කාර්යාලීය උපකරණ අළුත්වැඩියා කිරීම ( ගෘහ භාණ්ඩ, වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ, විදුලි පංකා, විදුලි කේතල, රූපවාහිනී යන්ත්‍ර ඇතුළු සියළුම වර්ගයේ විදුලි උපකරණ යනාදිය ඇතුළුව)
8. අංග රචනය , වේදිකා පසුතල නිර්මාණ , නර්තන සඳහා අවශ්‍ය උපකරණ සැපයීම, රංග වස්ත්‍රාභරණ හා රංග උපකරණ සැපයීම හා දේශීය ශාන්තිකර්ම සඳහා මිල ගණන් සැපයීම.
9. සියළුම ආකාරයේ වාද්‍ය උපකරණ හා සංගීත භාණ්ඩ අළුත්වැඩියා කිරීම.
10. උත්සව සඳහා වේදිකා, පුටු, මඩු, කූඩාරම්, ජෙනරේටර්, ජල බවුසර්, ජල ටැංකි, තාවකාලික වැසිකිළි ආදිය හා ඒ ආශ්‍රිත සියළු ද්‍රව්‍ය සැපයීම.
11. උත්සව සඳහා විසිතුරු මල් සැරසිලි හා විසිතුරු මල් ඇතුළු අනෙකුත් සැරසිලි ද්‍රව්‍ය සැපයීම
12. උත්සව සඳහා ආහාර පාන හා පානීය ජල බෝතල් සැපයීම.
13. වේයන්ගොඩ පුහුණු මධ්‍යස්ථානයේ උත්සව සඳහා ආහාර සැපයීමට ප්‍රාදේශීයව ලියාපදිංචි කිරීම.
14. නර්තන ඇඳුම් හා වෙනත් රෙදි සේදීම.
15. නර්තන ඇඳුම් හා නිල ඇඳුම් මැසීම/සැකසීම
16. වේදිකා පසුතල නිර්මාණය කිරීම, හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය කුලී පදනම මත සැපයීම.
17. ප්‍රවාහන හා ඉදිකිරීම් කටයුතු සඳහා වාහන, යන්ත්‍ර කුලියට සැපයීම.
18. ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධ උපදේශක සේවා සැපයීම.
19. වාහන අළුත්වැඩියාවන් , වාහන සේවා කිරීම්, වායු සමීකරණ අළුත්වැඩියා කිරීම හා වාහන වල සියළුම ආකාරයේ කුෂන් වැඩ
20. ප්‍රවාහන සැපයීම් දිවයින පුරා පිහිටි සංස්කෘතික මධ්‍යස්ථාන වල සිට - වෑන් (ආසන 12, 15) , බස් හා කුඩා ප්‍රමාණයේ ලොරි රථ.
21. පුහුණු මධ්‍යස්ථාන වල පුහුණු වැඩ සටහන් පැවැත්වීම ඉඩ පහසුකම්, ආහාර පාන නවාතැන් සැපයීම.ශාන්තිකර්ම සිදු කිරීම - ඌවරට / පහතරට / සබරගමු
22. සැලසුම් ශිල්පීන්, වාස්තු විද්‍යා ශිල්පීන් සහ සිවිල් ඉංජිනේරු
23. විදුලි යාන්ත්‍රික ඉංජිනේරු
24. ප්‍රචාරණය ප්‍රවර්ධනය සම්බන්ධ සේවා
25. උත්සව කළමනාකරණ කටයුතු ( Event Managing)
26. සංගීත ඛණ්ඩ නිර්මාණය කිරීම ( Music Tracks)
27. සංඥා භාෂා පරිවර්තනය කිරීම
28. දෙමළ භාෂා පරිවර්තනය කිරීම.
29. ශබ්ද විකාශන කටයුතු සිදුකිරීම
30. ප්‍රතිචක්‍රීකරන ද්‍රව්‍ය එකතු කිරීමේ කටයුතු සිදුකිරීම.
31. නවාතැන් පහසුකම් සැපයීම

* 02 හි උපදේශක නොවන සේවා යටතේ දක්වා ඇති 01/02/09/12/14/16/20 සේවාවන් සඳහා දිස්ත්‍රික් මට්ටමින් විශේෂයි.

03 **වැඩ :**

1. ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම් හා සුළු ඉදිකිරීම් ( ICTAD ආයතනයේ ලියාපදිංචි වී ඇති බව දැක්වෙන සහතික වල ඡායා පිටපත් ඇමිණිය යුතුය.)
2. ගොඩනැගිලි අභ්‍යන්තර පිරිසැකසුම් කටයුතු හා ඒ සම්බන්ධව අළුත්වැඩියා කටයුතු

04 **උපදේශක සේවා :**

1. කාර්ය මණ්ඩල ධාරිතා ප්‍රවර්ධන වැඩසටහන්
2. බාහිරගත පුහුණු වැඩමුළු (Outbound Training)
3. වෙබ් අඩවි සකස් කිරීම හා ප්‍රතිනිර්මාණය කිරීම

05 **සියළුම වර්ගයේ ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය හා උපකරණ සඳහා**

1. අමරදේව අසපුවේ ඉදිකිරීම් වැඩ සඳහා ප්‍රාදේශිය සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

**ලියාපදිංචි වීම සඳහා කොන්දේසි:**

1. 2026 වර්ෂය සඳහා මෙම අමාත්‍යාංශයට ඉහත සඳහන් භාණ්ඩ, සේවා හා වැඩ සැපයීම සඳහා ලියාපදිංචි වීමට අපේක්ෂා කරන සැපයුම්කරුවන් ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කර ඒ සඳහා අවශ්‍ය වන අයදුම්පත්‍ර රු.1,000.00 ක මුදලක් **(නැවත නොගෙවන රුපියල් දහසක්)** ගෙවා ගණකාධිකාරී (ප්‍රසම්පාදන) වෙතින් ලබාගත යුතුය.

2. මුදල් ගෙවූ කුවිතාන්සියේ පිටපතක් ද සමඟ ලියාපදිංචි වීම සඳහා වන අයදුම්පත් 2025.11.13 සිට 2025.12.02 දක්වා සතියේ වැඩකරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව.2.30 දක්වා ප්‍රසම්පාදන අංශයෙන් ලබාගත හැක.

3. එක් එක් අයිතමය වෙනුවෙන් වෙන වෙනම අයදුම්පත්‍ර ඉදිරිපත් කල යුතුය.

4. තම අයදුම්පත සමඟ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ ඡායා පිටපතක් හා අදාල ක්ෂේත්‍රයේ වසර තුනක (03) පළපුරුද්ද පිළිබඳ සහතික අමුනා එවිය යුතුය.

5. ලියාපදිංචි වීම සඳහා වන අයදුම්පත් 2025.12.23 දක්වා **"සභාපති, ප්‍රසම්පාදන මණ්ඩලය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය ( සංස්කෘතික කටයුතු අංශය ) , 08 වන මහල , සෙත්සිරිපාය, බත්තරමුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය හැක. අයදුම්පත් බහාලන කවරයේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2026"** යනුවෙන් සඳහන් කළ යුතුය. මෙම වසර සඳහා ලියාපදිංචි වී සිටින අයදුම්කරුවන් වුවද 2026 වසර සඳහා නැවත අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

6. ලියාපදිංචි සැපයුම්කරුවන්ට අමතරව ශ්‍රී ලංකා දුරකථන නාමාවලියේ රේන්බෝ පේජස් හී සඳහන් සැපයුම්කරුවන්ගෙන් ද ලංසු කැඳවීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතුය.

7. නියමිත අවස්ථාවලදී මිල ගණන් ඉදිරිපත් නොකරන හෝ නියමිත වේලාවට භාණ්ඩ නොසපයන හෝ මිල ගණන් ඉදිරිපත් කිරීමේ දි කොන්දේසි නොපිළිපදින සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය පූර්ව දැනුම් දීමකින් තොරව අවලංගු කරනු ලැබේ.

8. සැපයුම් හා සේවාවන් සඳහා අත්තිකාරම් මුදල් නොගෙවන අතර ගෙවීම් කරනු ලබන්නේ භාණ්ඩ හෝ සේවා සැපයීමෙන් පසුවයි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ගණකාධිකාරී ප්‍රසම්පාදන, (011-2875408) හා ප්‍රසම්පාදන අංශය (011-2862675) වෙතින් ලබාගත හැකිය.

ලේකම්,
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
08 වන මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.